


14 වන පිටෙන්

වෙනත් සංවර්ධන වැඩ සඳහා ශ්‍රමය යෙදවීමටත් එහි ජීවත්වන ජනතාව යොදා ගැනේ. එම මිනිසුන්ගේ ඕනෑ එපාකම් සියල්ලම සොයා බලනුයේ සමාගමේ පාලක පක්ෂය මගිනි. දූපතෙහි ජනගහනය ස්ථා වර මට්ටමකින් පවත්වා ගැනීම සඳහාද විවිධ උපක්‍රම භාවිතා කරන බවද අපට දැනගන්නට ලැබිණ.

එහි සිටින අතලොස්සක් වන දරුවන් සඳහා ගුරුවරු දෙදෙනෙක් පමණක් සිටින ප්‍රාථමික පාසැලක් තිබේ. මෙම පාසැලේ ඉගෙනුම ලබන දරුවන් අතරද, ප්‍රාථමික මට්ටමෙන් ඉහලට ඉගෙනීම කළ අය ගැන අසන්නටවත් නොමැත. වයස අවුරුදු දෙළහක් පමණ වන විට සියලුම දරුවන්ද දෙමාපියන් නිරත රැකියා වලට යොමු වන ඉව දකින්නට ලැබේ. එම දූපතේ ජීවන ක්‍රමයට අනුව අධ්‍යාපනයකින් ප්‍රයෝජනයක් නොවන බව ජනතාවට ඒත්තු ගොස් තිබේ. බලධාරීන්ද මේ ගැන කිසිම අවධාරණයක් යොමු නොකරති.

ජනතාවගේ සෞඛ්‍ය කටයුතු ගැන සොයා බැලිමට එක් හෙදියක් සහිත සෞඛ්‍ය මධ්‍යස්ථානයක්ද ඇත. යහපත් සෞඛ්‍ය තත්ත් වයකින් පසුවන ජනතාව රෝග පීඩා වලට ගොදුරු වන්නේද කලාතුරකිනි. අසනීප වූ අයෙකු ප්‍රතිකාර සඳහා ප්‍රධාන දූපතේ රෝහල කරා ගෙනයන්නේද කලාතුරකිනි.

කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා එක් කුඩා මෝටර් රථයක්, යතුරු පැදියක්, බයිසිකල් දෙකක් සහ බෝට්ටුවක්ද තිබේ.

මෙම මිනිසුන්ගේ තවත් විශේෂත්වයක් වනුයේ ඔවුන් කිසිම භාණ්ඩයක් මිලදී ගැනීම හෝ භාණ්ඩ අලෙවියක් නොකිරීමයි. ඔවුන් මුදල් නෝට්ටු හෝ කාසි පිළිබඳ කිසිවක් නොදන්නා තරම්ය. ඔවුන්ට මුදල් භාවිතය පිළිබඳව ඇත්තේ ඉතාමත් අල්ප දැනුමකි. අසනීපයකට ප්‍රතිකාර ලබාග ැනීම සඳහා ප්‍රධාන දූපතට ගෙන ගොස් ඇති කිහිප දෙනා පමණක් මුදල් භාවිතය දැක ඇත. මෙම මිනිසුන්ගේ සියලුම මුදල් වැයවන අවශ්‍යතා දූපත් සංවර්ධන සමාගම මගින් සිදු කෙරේ. ඒ වෙනුවට සෑම කෙනෙක්ම දිවයිනේ එදිනෙදා කටයුතු සඳහා සිය ශ්‍රමයෙන්ම දයක විය යුතුය.

ඔවුන්ගේ ඒකාකාරී එදිනෙදා ජීවිතය ගෙවෙනුයේ මෙසේය.
සියලුම ශ්‍රමිකයින් පෙරවරු අට වනවිට ආයතන කාර්යාලය අසලට රැස්විය යුතුය. මෙය දවසේ වැඩ බෙදාදෙනු ලබන උදේ පෙරෙට්ටුව යි. එහිදී වැඩිහිටි ගැහැණු පිරිමි කාටත් දිනයේ නියමිත වැඩ කටයුතු පැවරේ. වැඩි පිරිසක් ගොවි පළ වැඩ කටයුතු සඳහාය. පිරිමි කිහිප දෙනෙකු ඔවුන් සඳහා වෙන්කර තිබෙන ඔරු වලින් මසුන් ඇල්ලීම සඳහා මුහුදට යති. තවත් කිහිප දෙනෙකු උදලු අලවංගු ආදිය රැගෙන පාරවල් තැනීම සඳහා යති. පලතුරු සහ එළවළු වතුවල වැඩ සඳහාත් කුකුල් පාලන කටයුතු සඳහාත් ඉතිරි අය පිටත් වෙති. පාසල් නොයන වයසේ දරුවන් රැකබලා ගැනීමද සෞඛ්‍ය හෙදියට පැවරේ. මෙසේ සියලු දෙනාම තමන්ට අයිති වැඩ කටයුතු වල නිරත වීම ඔවුන්ගේ දින චරියාවයි. පාසල් යාම අත්හ ැර දැමූ, ශ්‍රමිකයින්ගේ ගණයට නොවැටෙන බාලක බාලිකාවන්ද තම දෙමාපියන්ගේ වැඩ කටයුතු සඳහා දූපත් සංවර්ධන සමාගමේ සේවකයන් තිදෙනෙකු යොදවා තිබේ. මොව්හු අප රටෙහි තේ වතුවල, තවමත් දකින්නට ලැබෙන කන්කානම වැනි භූමිකාවක් දරන්නෝ වෙති. සමාගම සහ සේවකයා අතර ගනුදෙනු කිරීමේ අතරමැදියෝද මොවුන්ම වෙති.

සෑම දිනකම ක්ෂේත්‍රයේ වැඩ කටයුතු අවස න්වන විට සියළුම ශ්‍රමිකයින්ගේ නිෂ්පාදන ද්‍රව්‍ය සහ එදිනෙදා පලදාව පාලන ආයතනය මගින් එකතු කරගනි. ඒවා අලෙවිය සඳහා හැකි ඉක්මනින් ප්‍රධාන දූපතට යැවේ. පැය අටක සේවයෙන් පසුව නැවත සවස පෙ රෙට්ටුවට පැමිණෙන ශ්‍රමිකයින්ට, එදිනෙදා ජීවත් වීමට අවශ්‍ය දේ එහිදී බෙදාදෙනු ලැබේ. සහල්, මස්, මාළු, එළවළු, කිරි ආදිය මේ අතර තිබේ. ඇඳුම් සපත්තු සහ වෙනත් පරිහරණය සඳහා අවශ්‍ය භාණ්ඩ සීමිත ප්‍රමාණයක් ලැබෙනුයේ වසරකට එක් වරක් හෝ දෙවරක් පමණකි. වැඩිහිටියෙකුට දින දෙක තුනකට වරක් බීර බෝතලයක්ද ලැබේ.

දරුවන්ගේ ඉගෙනීම කටයුතු සඳහා අවශ්‍ය සියලුම ද්‍රව්‍ය පාසලෙන්ම ලැබේ. මෙහි තවත් ලක්ෂණයක් වනුයේ පාසල් දරුවන් තමන්ගේ පොත් පත් පාසලේම තබා සවසට ගෙදරට පැමිණීමයි. ඒ දරුවන්ට පාසැලේදී පාසල් වැඩ මිස පාසැලේ ගෙදර වැඩ කිසිවක් නොමැතිය. පොත පත පාඩම් කිරීම කුමක්ද කියාවත් මෙම දරුවන්ට අවබෝධයක් නොමැකිය. ප්‍රාථමික අවදිය යන්තමින් පසුකරන දරුව න් ඉක්මණටම දුපතේ වැඩිහිටි ශ්‍රමිකයින්ට එකතුවී වැඩපලවල යෙදෙති.

මේ දිවයින් වැසියන් තමන්ගේ ජීවන ක්‍රමය ගැන සෑහීමකට පත් වී සිටින බව, අපට ඔවුන් සමඟ කථා බස් කිරීමට ලැබුණු සීමිත කාලසීමාවේදී දැනගන්නට ලැබිණ. සීමිත කාලසීමාවේදී දැනගන්නට ලැබිණ. ඔවුන් අතරින් බොහෝ දෙනෙකු කිසි විටෙක සිල්වට් දිවයිනේ සීමාවෙන් පිටතට ගොස් නැත. ඔවුනට ඒ ගැන හැඟීමක්වත් ඇති බවක් නොපෙනේ. ඔවුන්ගේ ශ්‍රමය සූරා කමින් පාලකයින් ධනය උපයන බවක් වත් ඔවුන් නොදන්නා සේය. මේ සම්බන්ධෙ යන් කිසිම අවස්ථාවක ඔවුන් දැනුවත් වී නොමැත්තේය.

ඒ අහිංසක මිනිසුන් ජීවත් වන කුඩා දිවයින බාහිර ලෝකයෙන් වෙන්වූ වෙනත් ලෝකය ක් මෙනි. අපේ සමහර අය පවසන පරිදි "දූපත් මානසිකත්වය" නමැති මිනිස් මනෝ භාවයත් තිබේනම් එහි "උපරිම ධනාත්මක වින්දනයක්" ලබන මිනිස් කොට්ඨාශයක් ලෙස සිල්වට් දිවයිනේ වැසියන් හැඳින්විය හැකිය. මොවුන් සඳහා වෙනත් විකල්ප සොයා ගැනීමට ද අවශ්‍යතාවක් නොමැති බව, එම දූපත් වැසියන් මෙන්ම, ඔවුන් හසුරුවනු ලබන පාලකයින්ද සිතනු නොඅනුමානය. කෙසේ වෙතත් මොවුන් නියමිත දෛනික වැඩ කොටස සඳහා තම ශ්‍රමය හරියාකාරව යොදවා ඒ වෙනුවෙන් දිනය අවසානයේදී ලබන සලාකය නිසා තෘප්තියක් ලබන බව පෙනේ. එය ශ්‍රමාභිමා නයක් ලෙසද ඔවුන් සිතන බව පැහැදිලිව දකින්නට ලැබේ.

මිනිස් ශ්‍රමය සූරාකෑම සඳහා යොදා ගන්නා, මෙම අවාසනාවන්ත වැඩ පිළිවෙළ, ආදි කාලීන වැඩවසම් පාලන ක්‍රමයේ හෝ වහල් සේවයේ, නෂ්ටාවශේෂයක් වශයෙන් නම්කළ හැකි බව මගේ විශ්වාසයයි.

(මෙම තොරතුරු දැනට දශක තුනකට පමණ ඉහත දී නිරීක්ෂණය කරන ලද ඒවා වේ. මේ වන විට තත්වය තරමක් දුරට හෝ වෙනස් වන්නට ඉඩ තිබේ.)